**ඉදිකිරීම් ආයතන , උපදේශක සේවා සපයන ආයතන සහ**

**කම්කරු ශ්‍රමය,ඉදිකිරීම් ද්‍රව්‍ය,යන්ත්‍ර, තාර හා තාර අශ්‍රිත නිෂ්පාදන, කොන්ක්‍රීට් මිශ්‍රණ සැපයුම්කරුවන්**

**ලියාපදිංචි කිරීම - 2025 වර්ෂය**

**වයඹ පළාත් සභාව**

01. 2025 වර්ෂය සඳහා පහත සඳහන් වැඩ විෂයන්ට වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා ඉදිකිරීම් ආයතන , උපදේශක සේවා සපයන ආයතන සහ වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන මාර්ග නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය කම්කරු ශ්‍රමය, ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍ර, තාර හා තාර ආශ්‍රිත නිෂ්පාදන, කොන්ක්‍රීට් මිශ්‍රණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| ලියාපදිංචි සංකේත අංකය | වැඩ විෂය | ආපසු නොගෙවන මුදල රු. ශත. |
|---|---|---|
| NWP/CS/E/Reg./2024/01 | ව්‍යුහ නිර්මාණ සැලසුම් සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම-2025 | 3000.00 |
| NWP/CS/E/Reg./2024/02 | විදුලි පද්ධති ස්ථාපිත කිරීම සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම - 2025 | 3000.00 |
| NWP/CS/E/Reg./2024/03 | ජල සැපයුම්, ජලනල වැඩ හා පල්දෝරු පද්ධති සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම - 2025 | 3000.00 |
| NWP/CS/E/Reg./2024/04 | වාස්තු විද්‍යාඥ සැලසුම් සඳහා උපදේශක සේවා සැපයීම - 2025 | 3000.00 |
| NWP/CS/E/Reg./2024/05 | කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම. (ගොඩනැගිලි/මාර්ග/ වාරිමාර්ග) - 2025 | 1000.00 |
| NWP/CS/E/Reg./2024/06 – 01 සිට 06 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කාර්යාල විසින් ඉටුකරනු ලබන නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කම්කරු ශ්‍රමය, ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 (විධායක ඉංජිනේරු කාර්යාල- කුරුණෑගල/ වාරියපොල/ කුලියාපිටිය/ මහව/ හලාවත/ ආණමඩුව) | එක් විධායක ඉංජිනේරු කාර්යාලයක් සඳහා රු.1000.00 |
| NWP/CS/E/Reg./2024/07 – 01 සිට 06 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කාර්යාල විසින් ඉටුකරනු ලබන නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 (විධායක ඉංජිනේරු කාර්යාල-කුරුණෑගල / වාරියපොල/ කුලියාපිටිය/ මහව/ හලාවත/ ආණමඩුව) | එක් විධායක ඉංජිනේරු කාර්යාලයක් සඳහා රු.1000.00 |
| NWP/CS/E/Reg./2024/08 – 01 සිට 06 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කාර්යාල විසින් ඉටුකරනු ලබන නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තාර හා තාර ආශ්‍රිත නිෂ්පාදන හා කොන්ක්‍රීට් මිශ්‍රණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 (විධායක ඉංජිනේරු කාර්යාල කුරුණෑගල / වාරියපොල/ කුලියාපිටිය/ මහව/ හලාවත/ ආණමඩුව) | එක් විධායක ඉංජිනේරු කාර්යාලයක් සඳහා රු.1000.00 |

02. <u>සුදුසුකම්</u>

**i.** වැඩ විෂය - **NWP/CS/E/Reg./2024/01, NWP/CS/E/Reg./2024/02, NWP/CS/E/Reg./2024/03**

ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අසාධුලේඛන ගතව නොසිටිය යුතු අතර උපදේශක සේවා සපයන ආයතනයක් ලෙස ලියාපදිංචි වීම හෝ රජයේ හෝ පෞද්ගලික අංශයේ උපදේශක සේවා සැපයීම පිළිබඳව පලපුරුද්දක් ඇති වරලත් ඉංජිනේරුවරයෙකු විය යුතුය.

ii. වැඩ **විෂය** - **NWP/CS/E/Reg./2024/04**

ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අසාධුලේඛන ගතව නොසිටිය යුතු අතර උපදේශක සේවා සපයන ආයතනයක් ලෙස ලියාපදිංචි වීම හෝ රජයේ හෝ පෞද්ගලික අංශයේ උපදේශක සේවා සැපයීම පිළිබඳව පලපුරුද්දක් ඇති වරලත් වාස්තු විද්‍යාඥයෙකු විය යුතුය.

**iii.** වැඩ **විෂය** - **NWP/CS/E/Reg./2024/05**

වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා (ගොඩනැගිලි/මාර්ග/වාරිමාර්ග) සීමිත මිලගණන් කැඳවීම යටතේ ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අසාධුලේඛන ගතව නොසිටිය යුතු අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**iv.** වැඩ **විෂය** - **NWP/CS/E/Reg./2024/06 , NWP/CS/E/Reg./2024/07, NWP/CS/E/Reg./2024/08**

වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන මාර්ග නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් වයඹ පළාතේ සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

03. ලියාපදිංචි කිරීමේ ලේඛන **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා), ඉංජිනේරු සේවා අංශය, තුන්වන මහල, පැහැසර ගොඩනැගිල්ල, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල** යන ලිපිනයට ලියූ අයදුම් පත්‍රයකින් ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් **2024.12.10** සතියේ වැඩ කරන දින වලදී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ලබා ගත හැකිය.

04. **iv.**වැඩ **විෂය** - **NWP/CS/E/Reg./2024/06 , NWP/CS/E/Reg./2024/07, NWP/CS/E/Reg./2024/08** සඳහා පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම **2024.11.20** දින **පෙ.ව.10.00**ට පැහැසර ගොඩනැගිල්ලේ 2 වන මහලේ පිහිටි රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

05. මුද්‍රා තබන ලද ලියාපදිංචි කිරීමේ ලේඛන **2024.12.11** දින පෙ.ව.10.00 ට පෙර ලැබෙනසේ **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), ඉංජිනේරු සේවා අංශය, තුන්වන මහල, පැහැසර ගොඩනැගිල්ල, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කල යුතුවේ. අදාල වැඩ විෂය ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කල යුතුය.

06. අයදුම්පත් භාරගැනීම අවසන්වූ වහාම විවෘත කරන අතර අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ඒ සඳහා සහභාගී විය හැක.

07. වැඩි විස්තර **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)** ඇමතීමෙන් හෝ www.cs.nw.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

දුරකථන අංකය- 037-2227664 ෆැක්ස්- 037-2227664 ඊ-මේල් - dcs.eng.nwp@gmail.com

ප්‍රධාන ලේකම් / සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
දිනය – **2024.10.30**